# ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
# இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சபை
# SRI LANKA EXPORT DEVELOPMENT BOARD

**වෙළඳ අමාත්‍යාංශය**

# ඇබෑර්තු

අපනයන ප්‍රවර්ධනය සහ සංවර්ධනය කිරීම සඳහා වූ ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය වන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB), ජාත්‍යන්තර වෙළඳාම තුළින් රටේ ආර්ථික සංවර්ධනය උදෙසා දායකත්වය සැපයීමට හැකි ඉහළ කළමනාකාරීත්ව කණ්ඩායමට එක්වීම සඳහා බලෝත්පාදක ස්වයං අභිප්‍රේරණය වූ සුවිශේෂී නායකත්ව හැකියාවන්ගෙන් යුත් වෘත්තිකයන්ට ආරාධනා කරනු ලැබේ.

## (1) අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (මුදල් හා පාලන) HM 2-1

**රැකියා විස්තරය**

ආයතනයේ සභාපති හා ප්‍රධාන විධායක විසින් පවරන පරිපාලන සහ මූල්‍යමය කටයුතු වලට අදාළ බලතල / කාර්යයන් / රාජකාරී ක්‍රියාත්මක කිරීමේ වගකීම සහ ආයතනයේ සියලුම අංශ / ඒකක වලට පරිපාලන සහ මූල්‍යමය කටයුතු සඳහා අවශ්‍ය මග පෙන්වීම ලබාදීම.

**සුදුසුකම් : (පහත සඳහන් I,II හෝ III)**

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාව / වාණිජ / කලා / ගිණුම්කරණය / මානව සම්පත් කළමනාකරණය / කෘෂිකර්මය / ව්‍යාපාර පරිපාලනය හෝ අදාළ ක්ෂේත්‍රයක උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් ලබාතිබීම හෝ වරලත් ගණකාධිකරණ ආයතනයක තනතුරට අදාළ විෂයපථයෙහි ආශ්‍රිත සාමාජිකත්වය සමග
රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර විස්සක (20) ක කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද ලබා තිබිය යුතු අතර, එයින් වසර පහක් (5) ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.

II. තනතුරට අදාළ ක්ෂේත්‍රයක වරලත් ගණකාධිකරණ ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම සහ සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහළවක (15) ක පළපුරුද්ද ලබා තිබිය යුතුය.

III. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාව / වාණිජ / කලා / ගණකාධිකරණය / මානව සම්පත් කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය හෝ අදාළ ක්ෂේත්‍රයක උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයක ආචාර්ය උපාධියක් ලබා තිබීම සහ සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක අවම වශයෙන් වසර පහක (5) ක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද ලබා තිබීම.

## (2) අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන) HM 2-1

**රැකියා විස්තරය**

ආයතනයේ සභාපති හා ප්‍රධාන විධායක විසින් පවරන සංවර්ධන, මෙහෙයුම් සහ තාක්ෂණික කටයුතුවලට අදාළ රාජකාරී / කාර්යයන් / බලතල ක්‍රියාත්මක කිරීමේ වගකීම සහ අලෙවි සංවර්ධන වැඩසටහන් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම සඳහා අවශ්‍ය මග පෙන්වීම ලබාදීම.

**සුදුසුකම් : (පහත සඳහන් I,II හෝ III)**

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාව / කෘෂිකර්මය / ව්‍යාපාර පරිපාලනය / ආර්ථික විද්‍යාව හෝ අදාළ ක්ෂේත්‍රයක උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ වරලත් ගණකාධිකරණ ආයතනයක තනතුරට අදාළ විෂය පථයෙහි ආශ්‍රිත සාමාජිකත්වය සමග
රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර විස්සක (20) ක කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද ලබා තිබිය යුතු අතර එයින් වසර පහක් (5) ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.

II. තනතුරට අදාළ ක්ෂේත්‍රයක වරලත් ගණකාධිකරණ ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම සහ සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහළවක (15) ක පළපුරුද්ද ලබා තිබිය යුතුය.

III. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාව / කෘෂිකර්මය / ව්‍යාපාර පරිපාලනය / ආර්ථික විද්‍යාව හෝ අදාළ ක්ෂේත්‍රයක උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයක ආචාර්ය උපාධියක් ලබා තිබීම සහ සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක අවම වශයෙන් වසර පහක (5) ක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද ලබා තිබීම.

**වැටුප් පරිමාණය** (1) හා (2)- HM 2-1

රු. 91,645/- 12 x 2,700 = රු. 124,045/-

ඉහත තනතුරු සඳහා වයස අවුරුදු 35 ට නොඅඩු හා 55 ට නොවැඩි ඉහළ නිපුණතා ඇති පුද්ගලයින් සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය ඇරයුම් කරයි. රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතනවල අපේක්ෂකයින්ට ඉහත වයස් සීමාව අදාළ නොවේ.

**වෙනත් ප්‍රතිලාභ (I) හා (2)**

- 2016.10.27 දිනැති PED 1/2015 (i) චක්‍රලේඛය අනුව වාහනයක් ලබා දෙනු ලැබේ.
- අපනයන සංවර්ධන මණ්ඩලයීය වෛද්‍යාධාර යෝජනා ක්‍රමයක්.
- ලබා නොගත් වෛද්‍ය, නිවාඩු මූල්‍යකරණය සහ වාර්ෂික ප්‍රසාද දීමනා
- රජයේ අනුමත සහන පොලී ප්‍රමාණයන් යටතේ නිවාස ණය හා ආපදා ණය
- සේවක අර්ථසාධක අරමුදල - සේවකයාගෙන් 10%, ආයතනයෙන් 15% සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල - ආයතනයෙන් 3%

ඔබ සුදුසු යැයි සිතන්නේ නම්, 2020.12.14 හෝ ඊට පෙර ඉහත තනතුරු සඳහා අයදුම් කිරීමට මෙයින් ආරාධනා කෙරේ.

අදාළ අයදුම්පත්‍රය අපනයන සංවර්ධන මණ්ඩලයේ 05 වන මහලේ පිහිටි මානව සම්පත් කළමනාකරණ අංශයෙන් හෝ www.srilankabusiness.com වෙබ් අඩවියෙන් ("Announcements" කාණ්ඩය යටතේ) ලබා ගත හැක. ලිපි කවරයේ ඉහළ වම් පස කෙළවරේ තනතුරු නාමය සඳහන් කරමින් සම්පූර්ණ ජීව දත්ත සඳහන් තිබි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් සහ අදාළ සියළුම සහතික පත්‍රවල පිටපත් අපනයන සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. අදාළ සහතිකවල පිටපත් සමග ඉදිරිපත් නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රාජ්‍ය අංශයේ සේවකයන්ගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුයි. එම අයදුම්පතේ අමතර පිටපතක් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර මණ්ඩලය වෙත එවන මෙන් අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ. තෝරා ගැනීම විධිමත් සම්මුඛ පරීක්ෂණයක් මගිනි.


**අධ්‍යක්ෂ ජනරාල්**

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**

**NDB - EDB ටවර්, අංක 42, නවම් මාවත,**
**කොළඹ 02.**

**දුර : 011 - 2300700, ෆැක්ස් : 011 - 2300715**

**වෙබ් :www.srilankabusiness.com**